# පිළිසඳර

2016
මැයි/ජූනි
pilisandara.npas@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of The National Photographic Art Society of Sri Lanka


## 63 වන වාර්ෂික මහා සභාව ජූලි 17

2016 වසර සඳහා වන වාර්ෂික මහා සභා රැස්වීම ජූලි මස 17 වැනි ඉරු දින පෙරවරු 9.00 ට කොළඹ ආනන්ද කුමාරස්වාමි මාවතේ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. නව නිලධාරීන් පත් කරගැනීම ඇතුළු සංගමයේ ඉදිරි කාර්යයන් සැලසුම් කරගැනීම සඳහා මෙදින ඔබගේ පැමිණීම අතිශයින් වැදගත් වේ. මේ සඳහා ඔබට ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරන අතර පැමිණීම පිළිබඳව අපි දැඩි අපේක්ෂාවෙන් පසු වෙමු. නිල ආරාධනා පත්‍රය සහ වැඩසටහන සඳහා පිළිසඳර ඇතුළු පිටු බලන්න.

## නිරෝගී මනසකින් ඡායාරූප දැකගන්නට *Positive Plus* වැඩමුළුව ජූලි 10 දා

නිරෝගී මනෝභාවයන් පෙරදැරිව ලෝකය දැකීමේ සහ නිර්මාණාත්මක රූප කලාවට ප්‍රවිශ්ට වීමේ සුවිශේෂ මනෝවිද්‍යාත්මක වැඩමුළුව ජූලි 10 වන දින රාජගිරිය Bird Park හි දී පැවැත්වීමට සංවර්ධන හා ප්‍රවර්ධන අංශය මගින් කටයුතු සැලසුම් කොට ඇත. විශේෂඥ වෛද්‍ය අසංක විජේරත්න මහතා ඇතුළු පුහුණු නිලධාරීන් කණ්ඩායමක් විසින් පවත්වනු ලබන මෙම වැඩමුළුවට දේශන, ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම් මෙන් ම ඔබගේ කායික, මානසික සෞඛ්‍යය පිරික්සන සායනයක් ද ඇතුළත් වේ.

සංගමයේ පාඨමාලා විද්‍යාර්ථීන්ට මෙන් ම සාමාජික ඔබ සැමට ද මෙම විශේෂ වැඩමුළුවේ අත්දැකීම් මහත් ඵලදායී වනු ඇත. ඡායාරූප ශිල්පීන් සඳහා වන මේ ආකාරයේ පළමු වැඩමුළුව ද *Positive Plus* වේ. ඉඩකඩ සීමිත බැවින් ඔබේ පැමිණීම 0714894848 අංකයෙන් සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ තුෂාර සමරකෝන් මහතා අමතා සනාථ කරන්න. සාමාජිකයින් සඳහා වන විශේෂ සහන පිරිවැය රු. 1500/= ක් වන අතර ව්‍යාපෘතියට අදාළ ලිපිගොනුව, දිවා ආහාර, උදේ හා සවස තේ පැන් සහ සහභාගීත්ව සහතිකයක් ද ඔබ වෙනුවෙන් පිරිනැමේ.

## සංගමයේ ඉදිරි වැඩසටහන්

විද්‍යාර්ථීන්ට අනිවාර්යයි. සාමාජික ඔබ සැමගේ පැමිණීම ද විශේෂ සාර්ථකත්වයට හේතුවකි.

| | | |
|---|---|---|
| ජූනි | 05 | මහාබෝධි විදුහලේ ඡායාරූප පංතිය |
| ජූනි | 12 | කැලණි විහාර ප්‍රායෝගික වැඩමුළුව |
| ජූනි | 26 | සාමාජික ඡායාරූප ප්‍රදර්ශනය සහ ඡායාරූප පංතිය |
| ජූලි | 02 | සාමාජික ඡායාරූප ප්‍රදර්ශනය |
| ජූලි | 03 | මහාබෝධි විදුහලේ ඡායාරූප පංතිය |
| ජූලි | 10 | Positive Plus වැඩමුළුව |
| ජූලි | 17 | වාර්ෂික මහා සභාව |
| ජූලි | 24 | සත්වෝද්‍යාන ප්‍රායෝගික වැඩමුළුව |
| ජූලි | 31 | ඡායාරූප පංති |

## සාමාජික ඡායාරූප ප්‍රදර්ශනයට ඔබට ආරාධනා !

සමාජ සේවා අංශයේ චාරිකා සහ අවුරුදු උළෙල ව්‍යාපෘතිවල දී ගනු ලැබූ ඡායාරූපවලින් සමන්විත නව නිර්මාණ එකතුව ජූලි 02 වැනි සෙනසුරාදා දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී ප්‍රදර්ශනය කෙරේ. සමාරම්භක උත්සවය පෙරවරු 9.00 ට පැවැත්වේ. ඔබට ඒ සඳහා ගෞරවයෙන් ආරාධනා කරමු.


QD/95/NEWS/2016



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# සමාජසේවා අංශයෙන් ඡායාරූප ප්‍රදර්ශනයක්

## 2016 සාමාජික ඡායාරූප දැක්ම

සමාජසේවා හා සුබසාධන අංශය මගින් මෙම වසරේ පවත්වන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඇතුළත් ඡායාරූප ප්‍රදර්ශනයක් හා තරගයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම ප්‍රදර්ශනයේ අංශ දෙකකි.

**1. චාරිකා ඡායාරූප තරග අංශය**

පසුගිය මාර්තු 18 හා 20 දිනවල පැවැත්වුණු නුවර එළිය චාරිකාවේ දී ගනු ලැබූ ඡායාරූප මේ සඳහා අදාළ වේ. මෙම තරග අංශය විවෘත තේමාවකින් යුක්ත වේ.

**2. අවුරුදු උත්සව ඡායාරූප තරග අංශය**

අප්‍රේල් මස 24 වැනි දින පවත්වන ලද සාමාජික සුහද හමුව හා අවුරුදු උත්සවයේ දී ගනු ලැබූ ඡායාරූප මෙම අංශයට අදාළ වේ. ක්‍රියාකාරකම් සහිත ඡායාරූප (*Action Photo*) පමණක් මේ සඳහා ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

අදාළ ඡායාරූප සියල්ල දිග පැත්ත අඟල් 20'' නොඉක්මවන ලෙස හා පළල පැත්ත අඟල් 8''ට නොඅඩු වන ලෙස මුද්‍රිත පිටපත් (*Hard Copies*) වශයෙන් ඉදිරිපත් කළ යුතු ය. එක් අයෙකුට එක් අංශයකට ඡායාරූප 04 බැගින් ඉදිරිපත් කළ හැකි අතර පළමු හා දෙවන තරග අංශවලට ඉදිරිපත් වීමේ හැකියාව ඇත්තේ එම කාර්යයන් සඳහා සහභාගි වූ සහ ඒ බව අදාළ අත්සන් ලේඛන මගින් සුබසාධන අධ්‍යක්ෂවරයා ලවා සනාථ කළ හැකි අයට පමණි.

ඡායාරූප ඉදිරිපත් කිරීමේ දී ඒ සමග සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු අයදුම් පත්‍රය පහත දක්වේ. ඡායාරූප ප්‍රදර්ශනය ජූලි 02 වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිතව ඇත.

**ඡායාරූප බාරගන්නා අවසන් දිනය : 2016 ජූනි 19**

## සාමාජික ඡායාරූප ප්‍රදර්ශනය 2016

### වාර්ෂික චාරිකාව සහ අවුරුදු උළෙල - අයදුම් පත්‍රය

| තරග අංශය | මාතෘකාව | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|
| වාර්ෂික චාරිකාව<br>(2016 මාර්තු 18 - 20) | 1.<br>2.<br>3.<br>4. | |
| අවුරුදු උළෙල<br>(2016 අප්‍රේල් 24) | 1.<br>2.<br>3.<br>4. | |

නම: ........................................................................................................ සාමාජික අංකය: ....................

ලිපිනය: ...............................................................................................................................................

දුරකතන අංකය: ................................................ නිවස: ................................ ජංගම: .................................

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සමාජසේවා හා සුබසාධන අංශය මගින් සංවිධානය කෙරුණු ඉහත සඳහන් වැඩසටහනට / වැඩසටහන්වලට මා සහභාගි වූ බවත්, මේ සමග ඉදිරිපත් කරන කෘති මගේ ම නිර්මාණ බවත් මෙයින් සහතික කරමි.

දිනය: ...............................

.............................................................
ශිල්පියාගේ / ශිල්පිණියගේ අත්සන

## සහතික කිරීම

ඉහත නම් සඳහන් අප සාමාජිකයා / සාමාජිකාව තමන් ඡායාරූප ඉදිරිපත් කරන ව්‍යාපෘතියට / ව්‍යාපෘතිවලට සහභාගි වූ බව සහතික කරමි.

.............................................................
දිනය: ............................... අධ්‍යක්ෂ - සමාජසේවා හා සුබසාධන

**LNPAS, ANPAS, FNPAS අයදුම් කිරීම ජූනි 30 ට පෙර**

*2016 වසර සඳහා උක්ත සම්මාන අයදුම් කිරීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් අදාළ අයදුම්පත් ජූනි මස 30 දිනට පෙර ගරු ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කරන්න. මෙම ඇගයීම් චක්‍රලේඛ අංක පරි/007/004 ප්‍රකාරව සිදු කෙරෙන අතර වැඩි විස්තර ගරු ලේඛකාධිකාරි වෙතින් විමසන්න.*

# නිල ආරාධනා පත්‍රය

හිතවත් සාමාජික / සාමාජිකාවන් වෙත,

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 63 වන වාර්ෂික මහා සභා රැස්වීම**

**දිනය** **: 2016 ජූලි 17 ඉරු දින**

**ස්ථානය** **: කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරය**

**වේලාව** **: පෙ.ව. 9.00**

**ඉතා වැදගත්, ඔව් ඔබේ පැමිණීම ඉතාම වැදගත්....**

මූලස්ථානය ගොඩනැගීම ගැන තීරණාත්මක කතිකාව සඳහා සංගමය වෙනුවෙන් එදින ඔබේ පැමිණීම ඉතාමත් ම වැදගත් .....

**මේ සෙනෙහෙබර ආරාධනය ඒ යුතුකම උදෙසා යි ..**

**- ගරු අධ්‍යක්ෂ මණ්ඩලය -**

## 63 වන වාර්ෂික මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය

- ආමන්ත්‍රණය.
- පොල්තෙල් පහන දැල්වීම.
- ජාතික ගීය වාදනය කිරීම.
- සභාව පිළිගැනීම.
- අප අතුරින් වියෝවූ සාමාජික / සාමාජිකාවන් සිහි කිරීම.
- ලිපි කියවීම.
- පසුගිය රැස්වීමේ වාර්තාව සභාගත කිරීම සහ සභා සම්මත කිරීම.
- වාර්ෂික ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම.
- වාර්ෂික අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම සහ සභා සම්මත කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස්වීම.
- තාවකාලික සභාපතිවරයෙකු පත්කිරීම.
- තාවකාලික ලේකම්වරයෙකු පත්කිරීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගැනීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩලය දිවුරුම් දීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩලය අසුන් ගැනීම
- සාමාජික අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීම.
- නව සභාපතිවරයාගේ ආමන්ත්‍රණය.
- විධායක අධ්‍යක්ෂවරයාගේ ස්තුති කතාව.
- විසිර යාම.

මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කිරීමට ඇති ඔබගේ යෝජනා 2016 ජූලි මස 10 වන දිනට පෙර විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, 170, කොලොන්නාව පාර, දෙමටගොඩ යන ලිපිනයට ලැබෙන්නට සලස්වන්න. ඔබගේ පැමිණීම 2016 ජූලි මස 10 වන දිනට පෙර 077 7519679 / 071 4424895 / 071 8106680 අංකයක් අමතා තහවුරු කිරීම සංවිධාන කාර්යයට පහසුවකි.

# හඳුනාගත්තොත් ඔබ මා...

## ශාන්ත වීරසිංහ - ලංකාවත්, ලෝකයත්, ජීවිතයත් ජයගත් ඡායාරූප කලාවේදියා



එක්දහස් නවසිය හතළිස් නවයේ සැප්තැම්බර් 26 වැනි දින මොලොව එළිය දුටු ශාන්ත වීරසිංහ අධ්‍යාපනය සඳහා පන්නිපිටිය ධර්මපාල විදුහලට පා එසවූයේ සිය බාල සොහොයුරා ද කැටුව ය. පාසල් වියේ පටන් ම ඡායාරූප ශිල්පයට ඇලුම් කළ ඔහු ඒ පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් හා හෘදයංගම අත්දැකීමක් පතා සංගමයට එක්වූයේ හැටේ දසකයේ අග භාගයේ දී ය. එවකට වසර හතරක් ව තිබූ සංගමයේ ඩිප්ලෝමා පාඨමාලාවේ ශාන්තගේ සාමාජික අංකය වූ 363 ඉදිරියේ පැමිණීම 100% ලෙස සටහන් ව තිබිණි. ඔහුගේ ආසාවේ උනන්දුවේ සහ කැපවීමේ තරම පෙන්නුම් කළ ප්‍රධාන සාධකය වූයේ, මාසික වාර්ෂික ඡායාරූප තරගවලින් ලත් නියත ජයග්‍රහණයන් සහ ඩිප්ලෝමාවෙන් වසරක් ගතවන විට දිනාගත් *ANPAS* සම්මානයත් ය.

ඉරුදින සවස්වරුවේ මහාබෝධි විදුහලේ පැවති ඡායාරූප පංතිය ශාන්තගේ ජීවිතයට අරුණලු උදා කළේ ය. ඡායාරූප ශිල්පය මෙන් ම සමාජය, සංස්කෘතිය, මානව භක්තිය ඔහුගේ ජීවිතයට එන්නත් කරන්නට මේ වැඩපිළිවෙළ සැබෑ වශයෙන් ම පොහොසත් විය. පංති නිමවීමෙන් පසු විල්සන් හැගොඩ සූරීන් සමග මරදාන පොලිස් නිවාස වෙත පානැගීම පුරුද්දක් කොටගත් ගුරු සිසු පිරිස එවක ඡායාරූප සංගමයේ සුලබ දසුනකි. ශාන්තගේ ශිෂ්‍ය අවධියේ ඔහුත් සමග ඒ. ඩී. ධර්මසේන, හෙන්රි දිසානායක, වොල්වින් සිරිවර්ධන, එච්. එම්. ආර්. පෙරේරා, හැරල්ඩ් ගුණසේකර, රවීන්ද්‍රසිරි සමරකෝන්, කේ. ඒ. සිරිවර්ධන, ආරිය බණ්ඩාර සමරකෝන්, වයික්කාලේ විල්බට් ප්‍රනාන්දු ඇතුළු පිරිස හැගොඩ මහතා පිරිවරා එසේ ගමන්ගත් හැටි ශාන්තට හොඳහැටි මතක ය. ඇඳිරි වැටෙන තුරු විවිධ මාතෘකා ගැන කතා කරන මේ පිරිස නන්දා හැගොඩ මහත්මියගේ තේ කෝප්පයෙන් නව පණක් ලබයි. ලාල්, පාලිත, අනුර යන හැගොඩ පවුලේ සොහොයුරන්ගේ හිත මිත්‍ර සත්කාරය ද සමග ඔවුන් යළි නිවෙස් බලා යන්නේ මහත් දැනුමක්, රසයක් හා සහෝදරාත්මක බැඳීමක් ද හදවතට තුරුලු කොට ගනිමිනි.

ශාන්ත වීරසිංහයන් මුල පටන් ම පෙන්නුම් කළ දක්ෂතා හේතු කොට ගෙන සංගමයේ දෙවන වසර ඉගෙන ගනිමින් සිටිය දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඡායාරූප ශිල්පියෙකු ලෙස රජයේ රැකියාවකට හිමිකම් කීමට ඔහුට හැකි විය. රැකියාවත් සමග තවතවත් ඡායාරූප ශිල්පයේ ශාස්ත්‍රීය, ව්‍යවහාරික හා නිර්මාණාත්මක වටිනාකම් සොයා යන්නට ඔහු අධිෂ්ඨාන කොටගත්තේ ය. ඡායාරූප ශිල්ප ඩිප්ලෝමාව දිනාගැනීමෙන් පසු ගුරුභවතෙකු වශයෙන් සංගමයේ පංතිවල සිය විෂය ඥානය බෙදා දුන් ශාන්ත, සංගමයේ සියලු ආකාරයේ වැඩකටයුතුවලට උර දෙන මුල් පෙළේ ක්‍රියාකාරිකයෙකු විය. 07 වැනි අන්තර්ජාතික ප්‍රදර්ශනයේ ලේකම්වරයා වූ ඔහු සිය ප්‍රයත්නයේ ජාත්‍යන්තර මට්ටම සලකුණු කළේ එවක ලොව කීර්තිමත් ඡායාරූප ශිල්පියෙකු වූ ඉන්දියාවේ වෛද්‍ය ජී. තෝමස් මහතා ප්‍රධාන ආරාධිතයා වශයෙන් සමාරම්භක උළෙලට කැඳවමිනි.

මහගමසේකර සූරීන් රජයේ ලලිත කලායතනයේ අධිපතිව සිටි අවධියේ බී. පී. වීරවර්ධනයන් යටතේ වැඩිදුරටත් සිය ඡායාරූප ශිල්ප ඥානය පෝෂණය කොටගත් ශාන්ත, ජී. ඩී. එල්. පෙරේරා මහතාගේ 'කලාපෙළ'ට සම්බන්ධ වෙමින් සිනමා අධ්‍යයනයට ද යොමු විය.

අනතුරුව ඔහු ප්‍රවීණ සිනමා කැමරා ශිල්පී සුමිත්ත අමරසිංහයන් වෙතින් ගුරුහරුකම් ලබමින් පී. යූ. පතිරණ මහතා යටතේ වර්ණ ඡායාරූපකරණය ද ප්‍රගුණ කළේ ය.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ *FNPAS* සම්මානය බලාපොරොත්තුවෙන් ශාන්ත වීරසිංහ 1975 දී *Iris* ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී පැවැත්වීය. කළුසුදු ඡායාරූප 242කින් සමන්විත වූ එය ආචාර්ය ආතර් සී ක්ලාක් සූරීන්ගේ පවා පැසසුමට බඳුන් වූවක් විය. ප්‍රදර්ශන සමරු කලාපයට පෙරවදනක් සැපයූ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් ශාන්තගේ ඡායාරූප ගැන මෙසේ සඳහන් කරයි.

*"ශාන්ත වීරසිංහගේ නිසල රූ වෙතින් ලෝකයේ චංචල භාවය අපට දැනේ. අසුන්දරත්වය තුළින් සුන්දරත්වය මෝදු වේ. සුන්දරත්වයේ අසුන්දර, අප්‍රියකර, විෂය ගති ලක්ෂණ හෙළිපෙහෙළි වේ. මානව සංහතිය සොම්නසින් ඉපිල නගන සිනා හඬ මෙන් ම, මියුඹුහුරු ලමින් වේදනාවෙන් පරිපීඩිතව කරන ඉකිබිඳීම අපට ඇසේ."*

ශාන්ත වීරසිංහයන්ගේ හැකියාව හොඳින් වටහාගත් එවක රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ආචාර්ය සරත් අමුණුගම මහතා, රජයේ නිල ඡායාරූප කාර්යයන්ට ඔහු කැඳවීය. ජේ. ආර්. ජයවර්ධන මහතා ජනාධිපති පදවියට පත්ව කොළඹ දී දිවුරුම් දීම හා දළදා මාලිගාවේ සිට ජාතිය ඇමතීම ඒ අතර විශේෂිත වේ. පණ්ඩිත් අමරදේවයන්ගේ 50 වන ජන්ම දිනය නිමිත්තෙන් පැවති 'ශ්‍රවණරමණී' ප්‍රසංගයේ නිල ඡායාරූප ශිල්පියා වූයේ ද ශාන්ත ය. 'සප්ත කන්‍යා' ගුවන් අනතුර සැලවූ සැනෙකින් හෙන්රි දිසානායකයන් ද සමග එහි ගිය ශාන්ත අනතුරේ බිහිසුණු බව අව්‍යාජ ලෙස රූපයට නැගීය. නුදුරු දින කිහිපය තුළ එම ඡායාරූපවලට සිළුමිණ, *Observer* පුවත්පත්වල මුල් පිටු විවර වූයේ, වෘත්තීය ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පීන් පසෙකට ඇද දමමිනි.

ඡායාරූප කලාවේ ජාත්‍යන්තරයට පා තැබූ ශාන්ත වීරසිංහ රුසියාවේ ප්‍රව්දා පුවත් සේවය සංවිධානය කළ ජාත්‍යන්තර ඡායාරූපකරණයේ ප්‍රථම ස්ථානයත්, *South East Asia Tourism* මගින් සංවිධානය කළ ජාත්‍යන්තර තරගයේ හොඳ ම වනජීවී ඡායාරූපයටත් හිමිකම් කීය. ඒ සමග ම ඕස්ට්‍රේලියාව, පෝලන්තය, චිලී, ඉන්දියාව, ජර්මනිය යන රටවල ඡායාරූප ප්‍රදර්ශනය කරන්නට සහ සම්මාන සහතික දිනාගන්නට ශාන්තට හැකි විය. යුනෙස්කෝව මගින් පැවැත්වූ

*'Sri Lanka Today'* ඡායාරූප තරගයේ ප්‍රමුඛස්ථානය ද ශාන්තගේ ජීවිතයේ වැදගත් මතක සලකුණකි. මේ සියලු හපන්කම් සහිතව ඔහු 1980 දී දිවයිනෙන් බැහැර වූයේ සංගමයට ද රටට ද සැලකිය යුතු රික්තයක් ඇති කරවමිනි.

දස අවුරුදු කාලයක් *Dubai* හා *Sharjah* රාජ්‍යයන්හි වර්ණ රසායානාගාරවල සේවය කළ කාලයේ නිරන්තරයෙන් ඡායාරූප ප්‍රදර්ශන හා තරග සඳහා ඉදිරිපත් වීමේ ප්‍රතිඵලයක් ලෙස *'Ricoh Camera'* තරගයෙන් ප්‍රථම ස්ථානයත්, *'Pentax Camera'* තරගයෙන් දෙවන ස්ථානයත් ලබාගැනීමට ශාන්ත වීරසිංහයන් සමත් විය. ඔහු එරට ප්‍රධාන පුවත්පත් දෙක වන *'Gulf News'*, *'Khaleej Times'* මගින් සංවිධානය කරන *'Gulf News 1995 Photographer of the year'* සහ *'Khaleej times 1997 Photographer of the year'* සම්මාන ලබා, කැමරා උපකරණ හා මුදල් ත්‍යාග ලබාගත්තේ ලංකාවට කීර්තියක් අත් කර දෙමිනි.

1980 දී *Dubai* රාජ්‍යයේ *'Town Planning Photographer'* ලෙස තේරුන ශාන්ත වීරසිංහයන් ඊට වඩා පහසුකම් හා දීමනා රැසකින් යුත් *ADCO (Abu Dhabi Company for Oihore Oil Operations)* හා එක් වූයේ *'Geological Photographer'* ලෙස සේවය කිරීමට ය. 5000ක් පමණ සේවක පිරිසක් සිටි එම ආයතනයේ පැවති *'Photographer Club'* එකමුතුවට නව ජීවයක් දී *'Inter oil Company'* ඡායාරූප ප්‍රදර්ශන හා තරගවල *'Technical Coordinator'* ලෙස වසර 20කට අධික කාලයක් ඔහු සේවය කළේ ය. එම සංවිධානවල ඡායාරූප පංති ද පවත්වා තෙල් සමාගම් අතර ඉමහත් ප්‍රසාදයට පත් විය. *'Abu Dhabi Natural History Group'* සඳහා දේශන පැවැත්වූ හෙතෙම *'Abu Dhabi Cultural Foundation'* හි සන්ධ්‍යා ඡායාරූප පාඨමාලාවේ ආචාර්යවරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

සිය දීර්ඝ සෞන්දර්ය චාරිකාවේ දී සෙනෙහෙබර සහකාරිය චන්ද්‍රිකා වෙතින් ලත් සහයෝගය ආදරයෙන් සිහිපත් කරන ශාන්ත වීරසිංහ දූ, පුත් යුගලකගේ ආදරණීය පියෙකි. පදවි, තානාන්තර, නම්බු නාම පිටුපස හඹා නොගිය නිසාවෙන් ම ප්‍රීතිමත් හා සැහැල්ලු ජීවිතයක් ගත කරන්නට ඔහුට හැකියාව ලැබී ඇත. දැනට කැලිෆෝර්නියාවේ ලොස් ඇන්ජලීස් නුවර දිවි ගෙවන ශාන්ත තවමත් සංගමය සමග සම්බන්ධ වන්නේ ලෝකයේ දිග පළල තමන් තුළ ඇති ළෙන්ගතුකමට බාධාවක් නොවන බව සනාථ කරමිනි. අපි ඔහුට නිදුක් නිරෝගී සුව චිර ජීවනය පතමු!

*උදිත ගයාෂාන්*

---

# සාමාජික සුහද හමුවට මහ පිරිසක්

අප්‍රේල් මස 24 වැනි දින තිඹිරිගස්යාය හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනයේ දි පැවැත්වූ සාමාජික සුහද හමුවට සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ පවුල්වල අය 350කට ආසන්න පිරිසක් සහභාගි වූහ. කලෙකින් නොදුටු මුහුණු රැසක් එදින දවස පුරා අවුරුදු ක්‍රීඩාවල යෙදෙමින් ඔවුනොවුන් සමග සතුටින් කල් ගෙවූහ. තරග ජයග්‍රාහකයින් සැමටත්, පැමිණි කුඩා දරුවන් සැමටත්, උත්සවය සඳහා පළමුව පැමිණි සියදෙනාටත් විශේෂ ත්‍යාග පිරිනැමිණි. අවුරුදු උත්සවයක් ලෙසින් මෙවර සාමාජික සුහද හමුව සංවිධානය කර තිබීම කාගේත් පැසසුමට ලක් විය.

උත්සවයේ සංවිධාන කාර්යයන් සහ ප්‍රතිපාදන සපයාගැනීම පිණිස ගරු සමාජසේවා හා සුබසාධන අධ්‍යක්ෂ ඒ. ආර්. එස්. ආර්. සිංහබාහු මහතාගේ ආරාධනයෙන් විශාල පිරිසකගේ අනුග්‍රහය ලබාගෙන තිබිණි. හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනය සඳහා අනුග්‍රහය ලබාදුන් නාගරික මන්ත්‍රී රිසා සාරුක් මහතාට ද, ශබ්ද විකාශන පද්ධතිය සඳහා අනුග්‍රහය ලබා දුන් *Sounds Up* ආයතනයේ අධිපති චමල් මහතාට ද, මන්චි බිස්කට් ආයතනයේ අනුග්‍රහය ලබා දුන් සජිත් වික්‍රමාරච්චි මහතාට ද, තිළිණ සඳහා අනුග්‍රහය ලබා දුන් නවල්ටි ආයතනයේ අධිපති මෝතිලාල් හේවගේ මහතාට ද, බ්‍රිස්ටල් ආයතනාධිපති චන්දන විජේසේකර මහතාට ද සංගමයේ විශේෂ ගෞරවය හා ස්තුතිය පිරිනැමේ. එසේ ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ද, ශක්ති ආයතනයට ද, සාමාජික නාමාවලිය සඳහා අනුග්‍රාහක දැන්වීම ලබාදුන් සියලුම ආයතනවලට ද සංගමයේ ප්‍රණාමය හිමි වේ.

සමාජ සේවා හා සුබසාධන අධ්‍යක්ෂවරයාගේ විශේෂ මෙහෙයවීම අනුව ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායේ නිලධාරී කණ්ඩායමක් මෙහි සංවිධාන කටයුතු සහ විනිශ්චය සඳහා පූර්ණ වශයෙන් කැපවූහ. ඒ සමග විවිධ සහායන් ලබා දෙමින්, සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරමින් සහ සහභාගිත්වයෙන් සහය දැක්වූ අමරා වීරසේකර, උදේනි අල්විස් ඇතුළු අපගේ ගෞරවනීය සාමාජික භවතුන් ද ඔවුන්ගේ පවුල්වල අය ද ස්තුති පූර්වකව සිහිපත් කරමු.

---

# ඔබට හැකි නම් අපට කියන්න

- ඉරිදා දිනවල පස්වරුවේ බත්තරමුල්ල සිට පුරහල මහාබෝධි විදුහල දක්වා ප්ලාස්ටික් පුටු ප්‍රවාහනය සඳහා කුඩා ලොරියක් (ඩිමෝ බට්ටෙක් ප්‍රමාණවත් ය.) සහනදායී පදනමකින් සපයාගත යුතු ව තිබේ. ආරංචියක් වෙතොත් අපට කියන්න.
- 8' × 10' × 20' කන්ටේනර් පෙට්ටියක් කාගෙන් හෝ පරිත්‍යාගයක් වශයෙන් ලබාගත හැකි නම් (දැනට තාවකාලිකව හෝ) සංගම් මූලස්ථාන ඉඩමේ "ඉදිකිරීම් කාර්යාලයක්" සඳහා ඉන් ඉමහත් ප්‍රයෝජනයක් ඇත. එවැන්නක් සපයා දීමට යම් හැකියාවක් වෙතොත් දැනුම් දීම ලොකු උදව්වක්.
- පරිත්‍යාගශීලියෙකු වෙතින් හෝ ප්‍රාදේශීය දේශපාලනඥයෙකු වෙතින් සංගමයේ පංතිවල හා අනිකුත් කටයුතුවල දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ප්ලාස්ටික් පුටු 100ක් සහ රෙදි කුඩාරමක් (10' × 10' හෝ 10' × 20') සපයා දිය හැකි නම් එය සංගමය වෙත කෙරෙන මහත් උපකාරයකි. ඒ සඳහා කිසියම් සම්බන්ධීකරණයක් සකස් කර දීමට ඔබට හැකි නම් කරුණාකර දැනුම් දෙන්න.

උදිත - 0718106680 තුෂාර - 0714894848

**ඔන්න, කරනවා නම් වැඩ....**

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## ඡායාරූප ප්‍රදර්ශන සඳහා අනුග්‍රාහකත්වය (NPAS Patronage) පිරිනැමීමට අදාළ නිර්ණායක.

**අරමුණු**
ජාතික වශයෙන් ඡායාරූප ප්‍රදර්ශනවල විධිමත් බව සහ ප්‍රමිතිය ආරක්ෂා කරලීමත්, ඊට ජාත්‍යන්තර තලයේ පිළිගැනීමක් ලබාදීමත් මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂිත ය.

**අයදුම්කිරීමේ සුදුසුකම**
කිසියම් ඡායාරූප ශිල්ප සංවිධානයක් හෝ ඡායාරූප ශිල්පය හා සම්බන්ධ පිළිගත හැකි ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ඕනෑ ම සංවිධානයකට මෙම අනුග්‍රාහකත්වය අයදුම් කළ හැකි වේ.

**නිර්දේශ**
මෙරට පවත්වන ඡායාරූප ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අනුග්‍රාහකත්වය ලබාගැනීම පිණිස අනුගමනය කළ යුතු නිර්දේශිත ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

1. අදාළ සංවිධානය ආසන්න වසර 03 තුළ අඛණ්ඩ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කර තිබිය යුතු ය.

2. ඡායාරූප ශිල්පය හා සම්බන්ධ පිළිගත හැකි සුදුසුකම් සහිත අවම වශයෙන් තිදෙනෙකු ප්‍රදර්ශන සංවිධායක කමිටුවට ඇතුළත් විය යුතු ය.

3. අනුග්‍රාහකත්වය අයදුම් කළ හැක්කේ පිළිගත් ප්‍රමිතියට අනුකූල තේරීම් කමිටුවක් මගින් තෝරාගත් ඡායාරූප පමණක් ප්‍රදර්ශනය කෙරෙන ප්‍රදර්ශන සඳහා පමණි.

4. අවම වශයෙන් ප්‍රදර්ශනයේ එක් අංශයකට හෝ ශ්‍රී ලාංකික පුරවැසි භාවය සහිත ඕනෑ ම අයෙකුට නිර්මාණ ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්තා තිබිය යුතු ය.

5. ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන ජාතික මට්ටමේ හෝ අන්තර්ජාතික ප්‍රදර්ශන සඳහා පමණක් අනුග්‍රාහකත්වය අයදුම් කළ හැකි ය.

6. සමස්ත ලංකා මට්ටමේ ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීමේ දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.
   - 6.1. ලිපියක් මගින් අනුග්‍රාහකත්ව අයදුම්පතක් ගරු සභාපති, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, තැ.පෙ. 452, කොළඹ යන ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතු ය.
   - 6.2. අදාළ කොන්දේසි (පහත සඳහන් ය) සපුරන සේ සකස් කළ ව්‍යාපෘති සැලැස්ම සහ අනුග්‍රාහකත්ව අයදුම්පත ප්‍රදර්ශනය පැවැත්වීමට සිව් මසකට ප්‍රථම ඉහත ලිපිනයට යොමු කළ යුතු ය.
   - 6.3. ප්‍රදර්ශනයට නිර්මාණ කැඳවීමේ මුද්‍රිත අයදුම්පතක් විවෘත ව බෙදාහැරිය යුතු ය.
   - 6.4. ප්‍රදර්ශනය අළලා මුද්‍රිත සමරුවක් සම්පාදනය කළ යුතු ය. එහි ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ලාංඡනය සහ අනුග්‍රාහක ලියාපදිංචිය සඳහන් විය යුතු ය.
   - 6.5. ප්‍රදර්ශනය පොදු මහජනතාවට අවම වශයෙන් දෙදිනක් වත් නැරඹීමට අවකාශ සැලැස්විය යුතු ය.
   - 6.6. ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන සෑම නිර්මාණකරුවෙකුට ම මුද්‍රිත සමරුව ලබා දිය යුතු ය.
   - 6.7. මුද්‍රිත ඡායාරූප වශයෙන් ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන නිර්මාණ ඒවායේ හිමිකරුවන්ට නැවත ලබා දිය යුතු නමුත්, අංකිත මෘදු පිටපත් ලෙස ඉදිරිපත් කරන නිර්මාණ හිමිකරුවන්ට ආපසු ලබාදීම අනිවාර්ය නොවේ.
   - 6.8. නිර්මාණකරුවන් හා ප්‍රදර්ශනය සංවිධානය කරන ව්‍යුහය අතර නීතිය හමුවේ සනාථ කළ හැකි එකඟතා ගිවිසුමක් පවතින විටක එකී ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කෘතිවල පරිහරණ අයිතිය අදාළ සංගමය / ආයතනය වෙත පවරාගත හැකි ය.
   - 6.9. ඉදිරිපත් කරන කෘති අතුරින් ප්‍රදර්ශනය සඳහාත්, ජයග්‍රහණ සඳහාත් නිර්මාණ තෝරාගැනීම, පිළිගත හැකි සුදුසුකම් සහිත සාමාජිකයින්/සාමාජිකාවන් තිදෙනෙකුට නොඅඩු තේරීම් කමිටුවකින් සිදු කළ යුතු ය.
   - 6.10. ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතික පිරිනැමිය යුතු අතර, අවශ්‍ය නම් සහභාගීත්ව සහතික ද ප්‍රදානය කිරීමට අවසර ඇත. එකී සෑම සහතික පත්‍රයක ම ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ලාංඡනය සහ අනුග්‍රාහකත්ව ලියාපදිංචි අංකය සඳහන් විය යුතු ය.
   - 6.11. ප්‍රදර්ශනය සඳහා ලැබෙන නිර්මාණ භාවිතයට ගත හැක්කේ, ප්‍රදර්ශන කාර්යයට අමතර ව ඒ හා සම්බන්ධ ප්‍රචාරක, විචාරක කාර්යයන් සඳහාත් අදාළ සංවිධායකවරුන්ගේ වාර්තා සඳහාත් පමණි. ඉන් ඔබ්බෙහි වන කවර හෝ කටයුත්තක් සඳහා ඒවා යොදාගන්නේ නම් අදාළ නිර්මාණකරුවන්ගේ ලිඛිත අවසරය අවශ්‍ය වේ.
   - 6.12. ප්‍රදර්ශන ක්‍රියාවලිය පුරාවට නිර්මාණ එළිදැක්වීමේ, මාධ්‍යගතව පළකිරීමේ සහ පරිහරණය කිරීමේ සියලු කාර්යයන් 2000 අංක 36 දරන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බුද්ධිමය දේපළ පනතෙහි විධිවිධාන උල්ලංගනය නොකරන්නක් විය යුතු ය.

7. ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීමේ දී පහත සඳහන් කොන්දේසි අනුගමනය කළ යුතු ය.
   - 7.1. මෙම ප්‍රමිතිය පාදක කොටගෙන ඉදිරියේ දී ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ අනුග්‍රාහකත්වයෙන් ප්‍රදර්ශන සංවිධානය කිරීමට අයදුම් කළ හැකි වේ.
   - 7.2. ලිපියක් මගින්, අනුග්‍රාහක අයදුම්පතක් ගරු සභාපති, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, තැ.පෙ. 452, කොළඹ යන ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතු ය.
   - 7.3. අදාළ කොන්දේසි (පහත සඳහන් ය) සපුරන සේ සකස් කළ ව්‍යාපෘති සැලැස්ම සහ අනුග්‍රාහක අයුදුම්පත ප්‍රදර්ශනය පැවැත්වීමට හය මසකට ප්‍රථම ඉහත ලිපිනයට යොමු කළ යුතු ය.
   - 7.4. ප්‍රදර්ශනයට නිර්මාණ කැඳවීමේ විස්තර පත්‍රිකාව ජාත්‍යන්තර භාෂාවකින් හෝ දේශීය භාෂාවක් සමග ජාත්‍යන්තර භාෂාවක් සහිත ව හෝ මුද්‍රණය කළ යුතු ය.
   - 7.5. ජාත්‍යන්තර භාෂාවකින් ද යුතු සමරු කලාපයක් ප්‍රදර්ශනය අළලා නිකුත් කළ යුතු ය. එහි ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ලාංඡනය සහ ප්‍රදර්ශන ලියාපදිංචි අංකය ඇතුළත් විය යුතු ය. ප්‍රදර්ශනය සඳහා කෘති ඉදිරිපත් කරන සෑම නිර්මාණකරුවෙකුට ම එය ලබාදිය යුතු ය.
   - 7.6. පොදු මහජනතාවට අවම වශයෙන් දෙදිනක් වත් නැරඹීමට හැකි වන සේ ප්‍රසිද්ධ ස්ථානයක ප්‍රදර්ශනය පැවැත්විය යුතු ය.
   - 7.7. ප්‍රදර්ශනය සඳහා අභිමත ඇතුළත් වීමේ ගාස්තුවක් නියම කළ හැකි අතර, අවශ්‍ය නම් කෘති ආපසු භාරදීමේ තැපැල් ගාස්තුවක් ද අයකළ හැකි ය. එසේ වුව ද තැපැල් ගාස්තු නොගෙවන නිර්මාණකරුවන්ගේ කෘති ද ප්‍රදර්ශනය අවසානයේ ඔවුන් වෙත සුරක්ෂිත ව ලබාදීම අනිවාර්ය වේ. එහෙත් තම නිර්මාණ මෘදු පිටපත් ලෙස ඉදිරිපත් කරන නිර්මාණකරුවන් වෙත ඒවා ආපසු භාරදීම අත්‍යවශ්‍ය නොවේ.

7.8. ඉදිරිපත්කරන කෘති අතුරින් ප්‍රදර්ශනය සඳහාත්, ජයග්‍රහණ සඳහාත් නිර්මාණ තෝරාගැනීම, අවම වශයෙන් එක් FIAP සම්මානලාභියෙකු ඇතුළු ජාත්‍යන්තර සම්භාවනාවට පත් ඡායාරූප කලාවේදීන් තිදෙනෙකුට නොඅඩු තේරීම් කමිටුවකින් සිදු කළ යුතු ය.

7.9. එක් එක් තරග අංශයේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ රන්, රිදී හා ලෝකඩ පදක්කම් පිරිනැමීමට ක්‍රියා කළ යුතු ය. ඊට අමතර වශයෙන් ජයග්‍රාහකයන් සඳහා අභිමත පරිදි ත්‍යාග පිරිනැමීමට අවකාශ ඇත.

7.10. ජයග්‍රාහකයින් සඳහා පිරිනමනු ලබන සහතික පත්‍රයේ ආකෘතිය ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගරු සභාපති වෙතින් අනුමත කරවාගත යුතු අතර, එහි ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ලාංඡනය සහ ප්‍රදර්ශනයේ ලියාපදිංචිය සඳහන් ව තිබිය යුතු ය.

8. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ අනුග්‍රාහකත්වය ඉල්ලීමේ සුදුසුකම් ඇති කිසියම් සංවිධානයක්, එකී අනුග්‍රාහකත්වය සහිතව ප්‍රදර්ශනයක් පැවැත්වීමට අදහස් කරන්නේ නම් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

8.1. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකාවේ වරලත් නිලධාරීවරයාගේ උපදෙස් අනුව ඔහුගේ නිර්දේශ පරිදි අයදුම් කළ හැකි ය.

8.2. ඉහත 7.2. සිට 7.8. දක්වා වන කොන්දේසි සියල්ල අනුගමනය කළ යුතු ය.

8.3. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ අනුශාසකත්වය අයදුම් කරන විට ඒ හා සමග ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අනුග්‍රාහකත්වය ද ලබාගත හැකි ය.

8.4. එක් එක් තරග අංශයේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ රන්, රිදී හා ලෝකඩ පදක්කම් පිරිනැමීමට ද, ඉන් පසු එළැඹෙන සහතිකපත් 05 සඳහා ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ රිබන් තිළිණ කිරීමට ද ක්‍රියා කළ යුතු ය. ඊට අමතර වශයෙන් ජයග්‍රාහකයන් සඳහා අභිමත පරිදි ත්‍යාග පිරිනැමීමට අවකාශ ඇත.

8.5. ජයග්‍රාහකයින් සඳහා පිරිනමනු ලබන සහතික පත්‍රයේ ආකෘතිය ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ වරලත් නිලධාරී වෙතින් අනුමත කරවාගත යුතු ය. එහි අනුග්‍රාහක සංවිධානවල ලාංඡන සහ ලියාපදිංචි අංක ඇතුළත් විය යුතු ය.

9. ප්‍රදර්ශනයක් සඳහා අනුග්‍රාහකත්වය අයදුම් කිරීමේ දී අදාළ ලිපි ලේඛන සමග පහත සඳහන් ගාස්තු ද ගෙවිය යුතු ය.

i. ලියාපදිංචි ගාස්තුව
ii. ලේඛන ගාස්තුව
iii. පදක්කම් හෝ රිබන් සඳහා වන මුදල

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් සැලකෙන අතර, ලේඛන ගාස්තුව සහ පදක්කම් හෝ රිබන් සඳහා වන මුදල අවස්ථානුකූලව තීරණය කෙරේ.

10. ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අනුග්‍රාහකත්වය සහිතව පවත්වන ප්‍රදර්ශන අවසන් වූ පසු සංවිධායක සංගමය විසින් සපයනු ලබන තොරතුරු හා ස්වාධීන ඇගයීම් මත ප්‍රදර්ශනයේ තත්ව වාර්තාවක් සකස් කිරීම,

ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ වරලත් නිලධාරී,
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සභාපති හෝ
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ප්‍රදර්ශන අධ්‍යක්ෂ සතු වගකීමකි.

අනුග්‍රාහකත්වය අනුමත නොකරන අවස්ථාවල දී, අදාළ ගෙවීම් ද සමග අනුග්‍රාහකත්ව ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ බව ඉහත සඳහන් නිලධාරීන් අතුරින් එක් අයෙකු විසින් අයදුම්කාර සංවිධානයට ලිඛිත ව දැනුම් දිය යුතු වේ.

මෙය ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ (FIAP) ලේඛන අංක 2003/301E සහ INFO 2001/329 චක්‍රලේඛයට යටත් ව ක්‍රියාත්මක වේ.

## අපේ ශෝකය







- සංගමයේ ජ්‍යෝෂ්ඨතම සාමාජිකයෙකු වූ ඩී. ජී. රණතුංග මහතා රෝගාතුරව සිට අභාවප්‍රාප්ත විය. මිය යන විට 87 වන වියේ පසු වූ ඒ මහතා වසර 50කට අධික කාලයක් සංගමයේ පූර්ණ ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ අතර 1969 දී පිහිටුවන ලද කඳුරට ඡායාරූප සංගමයේ නිර්මාතෘවරයා ද වෙයි. එතුමාගේ ගෞරවනීය සේවාවට සංගමයේ ප්‍රණාමය පිරිනැමෙන් අතර සියලු සාමාජික භවතුන් එක් ව එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමු.
- වර්ෂ 1972 පටන් අප සංගමයේ සාමාජිකයෙකු ව සිටි කීර්තිමත් සිනමා ශාස්ත්‍රඥයෙකු වූ ආචාර්ය ඩී. බී. නිහාල්සිංහ මහතා 77 වසක් ආයු වළඳා හදිසියේ අප අතරින් වියෝ විය. සිනමාවේදියෙකු, සිනමා ශාස්ත්‍රඥයෙකු, චිත්‍රපට මාධ්‍ය කළමනාකරුවෙකු මෙන් ම අදීන පෞරුෂයකින් හෙබි ප්‍රතිබිම්බ කලා ආචාර්යවරයෙකු ද වූ ඒ මහතාට ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ උත්තමාචාරය පිරිනමමු.
- සංගමයේ ක්‍රියාකාරී සාමාජිකා රුක්ෂිලා වෙත්තමුණි මහත්මියගේ දයාබර පියාණන් හදිසියේ අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව අපගේ බලවත් ශෝකය පවුලේ සැම වෙත ප්‍රකාශ කර සිටිමු.
- සංගමයේ ජ්‍යෝෂ්ඨ සාමාජිකයෙකු මෙන් ම හිටපු විධායක අධ්‍යක්ෂවරයෙකු ද වන තිලක ආර්. වෙරළුපිටිය මහතාගේ නැන්දණිය අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව අපගේ බලවත් සංවේගය ප්‍රකාශ කර සිටිමු.
- ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ හිටපු සභාපතිවරයෙකු මෙන් ම එදා පටන් ම සංගමය වෙනුවෙන් සුවිශිෂ්ට සේවාවක් ඉටු කළ එච්. එම්. ආර්. පෙරේරා මහතා ටික දිනක් රෝගාතුරව සිට අභාවප්‍රාප්ත විය. ඒ මහතාගේ බිරිඳ වන මාලා වසන්තාදේවී මහත්මිය හා දරුවන් වන ජනාධි, තාරක, දේශාධි ද අප සංගමයේ සාමාජිකයන් වන අතර ඔවුන් වෙත සියලු සාමාජික සාමාජිකාවන්ගේ බලවත් ශෝකය පිළිගන්වමු. එච්. එම්. ආර්. පෙරේරා සූරීන්හට නිවන් සුව පතමු.

# 2016 අප්‍රේල් මාසික ඡායාරූප තරගය

2016 අප්‍රේල් මාසික තරගයේ ජයග්‍රාහක නාමලේඛනය, කෘති තේරීම සහ විචාරයට දායක වූ දෙටු සාමාජික පිරිස පහත සඳහන් ය.

**සමස්ත තරග ප්‍රතිඵල**

**කලු සුදු**

01. කුෂාන් විමුක්ති
02. මොහාන් ගුරුසිංහ
03. ගගන් කරුණාචන්ද්‍ර
04. මොහාන් ගුරුසිංහ
05. විරංග සංදීප පතිරගේ

**වර්ණ**

01. මධුරංග සමරනායක
02. ජීවන්ත ගුණසේකර
03. තාරක ගුණරත්න
04. එන්. මල්ලවාරච්චි
05. සුරේෂ් එස් වීරසිංහ

**ඇගයීම් කමිටුව :** බන්දු ගුණරත්න මහතා, බර්ටි ගුණසේකර මහතා, ශාන්ත ගුණරත්න මහතා.



'තනි වූ සිතුවිලි'
**කුෂාන් විමුක්ති**

# 2016 මැයි මාසික ඡායාරූප තරගය

2016 මැයි මාසික තරගයේ ජයග්‍රාහක නාමලේඛනය, කෘති තේරීම සහ විචාරයට දායක වූ දෙටු සාමාජික පිරිස පහත සඳහන් ය.

**සමස්ත තරග ප්‍රතිඵල**

**කලු සුදු**

01. කසුන් රණමුක - 'Analogues'
02. ගගන් කරුණාචන්ද්‍ර - 'Harsh life'
03. මොහාන් ගුරුසිංහ - 'Cheerful'
04. කුෂාන් විමුක්ති - 'ඇගේ බැල්ම'
05. කුෂාන් විමුක්ති - 'සිතුවිලි අතර'

**වර්ණ**

01. නිරංජලා අබේවික්‍රම - 'Beyond safe'
02. සුරේෂ් එස් වීරසිංහ - 'No title'
03. ගගන් කරුණාචන්ද්‍ර - 'Evening of life'
04. කසුන් රණමුක - 'One way'
05. මොහාන් ගුරුසිංහ - 'Kiln'

**ඇගයීම් කමිටුව :** ප්‍රියන්ත අමරසිංහ මහතා, කේ.ජී. කීර්තිරත්න මහතා, ඩී.කේ. ලැන්ටි මහතා.



**'Analogues'**
**කසුන් රණමුක**

## *2016 සාමාජික දත්ත සංග්‍රහය (Members Directory 2016)*

අප්‍රේල් 24 වැනි දින පැවැත්වූ සාමාජික සුහද හමුව හා අලුත් අවුරුදු උත්සවය අළලා සාමාජික දත්ත එකතුවක් මුද්‍රණය කොට බෙදාහරින ලදී. පිටු 120 කින් යුතු මෙම දත්ත සංග්‍රහයට ගෞරව සාමාජිකයින්, යාවජීව සාමාජිකයින් සහ සාමාන්‍ය සාමාජිකයින් අතුරින් සැලකිය යුතු පිරිසකගේ ද තොරතුරු ඇතුළත් ව ඇත.

ඉතා කෙටි දින ගණනක් ඇතුළත් සම්පාදන කරන ලද්දක් වීමත්, පසුගිය පිළිසඳර කලාපවලින් ඉල්ලා සිටි නමුදු සාමාජක තොරතුරු ඉදිරිපත් කර තිබූ සාමාජික සංඛ්‍යාවේ අති සීමිත බවත් නිසා සාමාජිකත්වය සහිත සියලු දෙනාගේ තොරතුරු මීට ඇතුළත් කිරීමට අපහසු විය. එසේ වුවද මෙම කාර්යය ලබන වසරේ වඩාත් සම්පූර්ණත්වයෙන් යුතු සාමාජික දත්ත එකතුවක් සඳහා වන සාර්ථක මුල් පියවරක් වේ.

මෙම සාමාජික දත්ත එකතුවට ඔබේ ද නම, ලිපිනය, දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපිනය සහ ඇතැම් විට ඡායාරූප ද ඇතුළත් වනු ඇත. ඔබේ පිටපත රු. 100/=ක මුද්‍රණ ගාස්තුව පමණක් ගෙවා සංගමයේ ඡායාරූප පංතිවල දී ලබාගත හැකි ය.

## මාසික තරග අනුග්‍රහය Colour①st වෙතින්

සංගමයේ මාසික ඡායාරූප තරග ජයග්‍රහණ සඳහා ත්‍යාග ලබාදීමට බොරැල්ල *Colour 1st* වර්ණ රසායනාගාරය ඉදිරිපත් වී සිටී. මේ යටතේ මාසික ඡායාරූප තරගවල වර්ණ සමග ඒකවර්ණ දෙඅංශයෙන්හි පළමු දෙවන හා තෙවන ජයග්‍රාහකයින් සඳහා ඡායාරූප මුද්‍රණය සඳහා තෑගි වවුචර ප්‍රදානය කෙරේ. මේ පිළිබඳව *Colour 1st* රසායානගාරයේ අධිපති අප සාමාජික දුෂාන් තරංග මහතාටත් ප්‍රධාන ඡායාරූප මුද්‍රණ ශිල්පී පාලිත මහතාටත් සංගමයේ කෘතඥතාව පිරිනැමේ.

## ඡායාරූප පරීක්ෂණ ලිඛිත කොටසේ ප්‍රතිඵල නිකුත් වේ

ජනවාරි මස පවත්වන ලද 2015 අධ්‍යයන වර්ෂයේ ඡායාරූප ශිල්ප පරීක්ෂණයන්හි ලිඛිත කොටස් ප්‍රතිඵල දැන් නිකුත් කොට ඇත. සාමාර්ථ්‍යය හා ඌන සාමාර්ථ්‍යය ලත් අපේක්ෂකයනට ප්‍රායෝගික පරීක්ෂණවලට ඉදිරිපත් විය හැකි අතර මේ දිනවල මහාබෝධි විද්‍යාලයේ දී එම ඇගයීම් පැවැත්වේ. වැඩි විස්තර හා විමසීම් ගරුලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න (071 4901200) මහතා වෙතිනි.

## CLAN දැන් අලුත් තැනක

ජ්‍යෙෂ්ඨ සාමාජික නන්ද ජයවර්ධන මහතාගේ Clan ආයතනය පසුගිය දා නුගේගොඩ සව්සිරි වෙළඳ සංකීර්ණයේ අංක: 610 දරණ ස්ථානයේ අලුතෙන් ආරම්භ කරන ලදී. කැමරා උපකරණ ගෙන්වීම හා අලෙවිය සඳහා ඡායාරූප ශිල්පීන් අතර නම දිනූ ආයතනයක් වන *Clan* හි ව්‍යාපාර කටයුතු වඩවඩාත් සඵල වේවායි ශුභාශිංසනය කරමු.

**පිළිසඳරට වෙහෙස මහන්සිය**

ප්‍රකාශන අධ්‍යක්ෂ ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ මහතා

පිළිසඳර - ප්‍රකාශන අනු කමිටුව

1 වසර - මින්දුරී අබේසේකර මෙය
චමින්ද වීරසිංහ මහතා
2 වසර - මදූෂිකා ලක්මාලි මෙය
ආර්. එම්. මඩවල මහතා
3 වසර - චින්තක දන්තනාරායන මහතා